නාගොඩ ප්‍රාදේශීය සභාව
ගාල්ල දිස්ත්‍රික්කය

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 ජුනි 23 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2013 මැයි 21 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2014 දෙසැම්බර් 22 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට නාගොඩ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.3.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම්**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2010 ජනවාරි 19 දිනැති අංක PED/54 දරන රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ චක්‍රලේඛය අනුව 2011 ජනවාරි 01 දින සිට පළාත් පාලන ආයතන විසින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළයුතු වුවත් එම ප්‍රමිති අනුගමනය කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය ඉදිරිපත් කර නොතිබුණි.

**1.3.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති**

සභාව විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශන සමග හෙළිදරව් කර නොතිබුණි.

**1.3.3 ගිණුම්කරණ අඩුපාඩු**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වැටුප් ප්‍රතිපූර්ණය සඳහා පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් ලද රු.10,326,429 ක මුදල සියලුම වැඩ සටහන් අතර විභජනය නොකර, එක් වැඩ සටහනක් යටතේ දක්වා තිබුණි.

(ආ) මූල්‍ය ප්‍රකාශනවල සමාලෝචිත වර්ෂය සඳහා විගණන ගාස්තු වෙනුවෙන් ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ඇ) ඉකුත් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මුදල් මාරු ගිණුමෙහි වූ රු.27,500 ක හර ශේෂය රු.227,500 ක් ලෙස ආදායමට ලියා හැර තිබූ අතර රු.27,500 ක බැර ශේෂය සමාලෝචිත

වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම් ගතකර තිබීමෙන් සමුච්චිත අරමුදල් ශේෂය රු.200,000 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) හඟරත්වල ප්‍රජා ශාලාව සඳහා යකඩ දොරවල් හා ජනෙල් ග්‍රිල් සෑදීම සඳහා සමාලෝචිත වර්ෂයේ දී දරන ලද රු.163,550 ක වියදම ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ පුස්තකාල පොත් මිලදී ගැනීම් රු.392,860 ක් වුවද, එය රු.439,009 ක් ලෙස ප්‍රාග්ධනිත කර තිබීමෙන් මූල්‍ය ප්‍රකාශනවල පුස්තකාල පොත් ගිණුම් ශේෂය හා ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායක වීමේ ගිණුම් ශේෂය රු.46,149 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඊ) 2013 ජනවාරි මාසයේදි ගෙවා තිබූ රු.110,000 ක හිඟ වැටුප සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස දක්වා තිබීමෙන් මූල්‍ය ප්‍රකාශනවල වියදම් රු.110,000 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(උ) සමාලෝචිත වර්ෂයේ උසාවි දඩ ආදායම රු.2,093,016 ක් වුවද, එය රු.2,174,109 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබීමෙන් සමාලෝචිත වර්ෂයේ ආදායම හා ණයගැතියන් රු.81,093 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඌ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට විශ්‍රාමික පළාත් පාලන සේවකයින් වෙනුවෙන් ගෙවිය යුතු විශ්‍රාම වැටුප් දායක මුදල් රු.2,359,377 ක් වෙනුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(එ) කොම්පෝස්ට් ව්‍යාපෘතිය සඳහා රොටරි වර්ගයේ හලන යන්ත්‍රයක් මිලදී ගැනීම වෙනුවෙන් ලැබිය යුතු මූලධන ආධාර රු.300,000 ක් හා ප්‍රාග්ධන වියදම් සඳහා මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදන සලසා නොතිබීමෙන් සමාලෝචිත වර්ෂයේ මූලධන ආධාර හා ප්‍රාග්ධන වියදම් රු.300,000 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඒ) අනුමැතියක් හා හඳුනා ගැනීමක් නොමැතිව 2013 ජනවාරි 01 දිනට ලැබිය යුතු මූලධන ආධාර ඌණ බිල් කිරීම් ලෙස රු.19,600 ක් හා අධි බිල් කිරීම් ලෙස රු.112,430 ක් ගැලපුම් කර තිබීමෙන් ණයගැති ශේෂය රු.92,830 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඔ) සමාලෝචිත වර්ෂය සඳහා පරිත්‍යාග ලෙස ලැබී තිබුණු රු.1,499,800 ක පිළිසරු ව්‍යාපෘති ආධාර සහ රු.706,000 ක පුරනැගුම ව්‍යාපෘති ආධාරවල එකතුව රු.2,205,800 ක් ස්ථාවර වත්කම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

(ඕ) ඉකුත් වර්ෂයේ කර්මාන්ත දෙකක් වෙනුවෙන් ලැබිය යුතු රු.948,775 ක මූලධන ආධාර සමාලෝචිත වර්ෂයේ මූලධන ආධාර ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

**1.3.4 නොසැසඳු පාලන ගිණුම්**

ගිණුම් විෂයයන් 05 කට අදාල පාලන ගිණුම් අනුව ශේෂයන් සහ උපයෝගී ලේඛන අනුව ශේෂයන් අතර රු.3,806,794 ක වෙනසක් නිරික්ෂණය විය.

**1.3.5 අවිනිශ්චිත ගිණුම්**

වර්ෂ තුනකට පෙර සිට පැවත එන රු.22,785 ක් වූ අවිනිශ්චිත ගිණුමේ බැර ශේෂය හඳුනාගෙන ගිණුම් ගැලපීමට සමාලෝචිත වර්ෂය තුළදී ද කටයුතු කර නොතිබුණි.

### 1.3.6 විගණනය සඳහා සාක්ෂි නොවීම

මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ එකතුව රු.80,596,420 ක් වූ ගනුදෙනු සම්බන්ධව හිමිකම් ඔප්පු, යාවත්කාලීනව පවත්වා ගෙන යනු ලැබූ ස්ථාවර වත්කම් ලේඛන, යාවත්කාලීන කරන ලද ණයගැති ලේඛනය, උපලේඛන හා කාල විශ්ලේෂණ ආදි සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ප්‍රාදේශීය සභාවේ ආදායම ඉක්ම වූ පුනරාවර්තන වියදම රු.3,630,007 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.1,280,440 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 වරිපනම් බදු

සභා බලප්‍රදේශයේ මාර්ග පද්ධති පහසුකම්, විදුලි පහසුකම්, දුරකථන පහසුකම්, ජල පහසුකම් හා කැලිකසල ඉවත් කිරීම ප්‍රාදේශිය සභාව විසින් කරන දියුණු කළ ප්‍රදේශ ලෙස සැලකිය හැකි නාගොඩ, උඩුගම, යටලමත්ත වැනි ප්‍රදේශ හඳුනාගෙන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134(1) හා (2) උප වගන්ති වල විධිවිධාන ප්‍රකාරව වරිපනම් බදු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

### 2.2.2 අක්කර බදු

2013 ජනවාරි 01 දිනට හිඟ අක්කර බදු ශේෂය රු.261,471 ක් වූ අතර වර්ෂයේ බිල් කිරීම් රු.61,952 ක් ද, අය කිරීම් රු.69,409 ක් ද විය. මේ අනුව 2013 දෙසැම්බර් 31 දිනට හිඟ ශේෂය රු.258,488 ක් වීමෙන් හිඟ අක්කර බදු අය කිරීමේ ප්‍රගතිය ඉතා පහළ මට්ටමක පැවති බව නිරීක්ෂණය විය.

### 2.2.3 වෙළඳ බලපත්‍ර ගාස්තු හා ව්‍යාපාර බදු

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149, 150(1) හා 152(1) වගන්ති යටතේ ඇතැම් වෙළඳ ව්‍යාපාර හා වෘත්තීන් සම්බන්ධව සභාව විසින් නිකුත් කරන ලද 2012 දෙසැම්බර් 28 දිනැති අංක 1791 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් නිවේදනය අනුව ඊට අදාළ ව්‍යාපාරවලින් වෙළඳ බලපත්‍ර හා බදු අයකල යුතු අතර ඒ සම්බන්ධයෙන් සිදු කරන ලද විගණන නියැදි පරීක්ෂාවේ දී පහත කරුණු නිරීක්ෂණය විය.

(i) බලපත්‍ර ගාස්තු අය කළයුතු ව්‍යාපාර ආයතන පිළිබඳ වාර්ෂික සමීක්ෂණයක් සිදුකර නොතිබුණි.

(ii) 2013 වර්ෂය තුළදී ව්‍යාපාර ආයතන 16 කින් වෙළඳ බලපත්‍ර ගාස්තු රු.10,200 ක් අයකර ගෙන නොතිබුණි.

(iii) සභා බලප්‍රදේශය තුල ඉදිකර තිබූ දුරකථන සම්ප්‍රේෂණ කුළුණු 08 කින් රු.45,000 ක ව්‍යාපාර බදු අය කරගෙන නොතිබුණි.

**2.2.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2013 දෙසැම්බර් 31 දිනට රු. 590,676 ක උසාවි දඩ හා රු. 1,245,420 ක් වූ මුද්දර ගාස්තු ලැබිය යුතුව තිබුණි.

**2.2.5 මාපලගම දෙමහල් වෙළඳ සංකීර්ණ ගොඩනැගිල්ල කඩකාමර බදු**

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(i) පළාත් පාලන කොමසාරිස්ගේ 2010 දෙසැම්බර් 27 දිනැති අංක: 2010/01 දරන චක්‍රලේඛයේ දක්වා ඇති පරිදි සෑම බදු ගිවිසුමක් ම වසර 03 කට වරක් යාවත්කාලීන කලයුතු වුවත්, බිම් මහලේ කඩ කාමර 04 ක සහ උඩු මහලේ කඩ කාමර 06 කට අදාලව බදු ගිවිසුම් අළුත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ii) බිම් මහලේ අංක 3 දරන කඩ කාමරය හා උඩුමහලේ අංක 6 දරන කඩ කාමරය සඳහා අවුරුදු 20 කට බදු ගිවිසුම් අත්සන් කර තිබුණි.

(iii) ගිවිසුමේ 02 වන කොන්දේසිය අනුව මාසික කුලිය ඒ ඒ මාසයේ 10 වන දින හෝ ඊට පෙර ගෙවිය යුතු වුවත්, 2013 දෙසැම්බර් 31 දිනට කඩ කාමර 11 කින් රු.173,350 ක බදු කුලී හිඟව පැවතුණි.

**2.2.6 තල්ගස්වල පොදු වෙළඳපොල කඩ බදු**

(i) පළාත් පාලන කොමසාරිස්ගේ 2011 ජනවාරි 01 දිනැති අංක:2010/01 දරන චක්‍රලේඛයේ දක්වා ඇති පරිදි සෑම ගිවිසුමක් ම වසර 03 කට වරක් යාවත්කාලීන කලයුතු වුවත්, කඩ කාමර 04 ක් 1985 දී සහ තවත් කඩ කාමරයක් 2007 දී එක් අවුරුදු කාල පරිච්ඡේදයක් සඳහා බදු දී තිබුණ ද, 2014 ඔක්තෝබර් 03 විගණන අවස්ථාව වන විටත් ගිවිසුම් යාවත්කාලීන කර නොතිබුණි.

(ii) ගිවිසුමේ 02 වන කොන්දේසිය අනුව මාසික කුලිය ඊළඟ මාසයේ 10 වන දිනට පෙර ගෙවිය යුතු වුවද, 2013 දෙසැම්බර් 31 දිනට කඩ කාමර 05 කින් රු.48,450 ක බදු කුලී හිඟව පැවතුණි.

**2.2.7 මාපලගම මංසන්ධියේ පැරණි කඩ කාමර බදු**

(i) පළාත් පාලන කොමසාරිස්ගේ 2011 ජනවාරි 01 දිනැති අංක: 2010/01 දරන චක්‍රලේඛයේ දක්වා ඇති පරිදි සෑම ගිවිසුමක් ම වසර 03 කට වරක් යාවත්කාලීන කලයුතු වුවත්, 1991 දී ගිවිසුම් අත්සන් කර තිබූ කඩ කාමර 04 ක ගිවිසුම් යාවත්කාලීන කර නොතිබුණි.

(ii) කඩ කාමර 04 කින් 2013 දෙසැම්බර් 31 දිනට රු.32,750 ක බදු කුලී හිඟව පැවතුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

(අ) 1988 අංක 74 දරන පනතින් සංශෝධිත 1975 අංක 01 දරන වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ පනතේ අවශ්‍යතාවයන් අනුව 2013 වර්ෂයේ දී උප සභාපති හා මන්ත්‍රීවරුන් 05 දෙනෙකු විසින් වත්කම් හා බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) 2002 අංක 14 දරන එකතු කල අගය මත බදු පනතේ විධිවිධාන අනුව, 2013 වර්ෂයේ සහ ඊට පෙර වර්ෂවල අයකර ගෙන තිබූ බදු මුදල රු.1,968,246 ක් සහ 2006 අංක 12 දරන මුද්දර ගාස්තු විශේෂ විධිවිධාන පනත අනුව, 2013 වර්ෂයේ සහ ඊට පෙර වර්ෂවල අයකර ගෙන තිබූ මුද්දර බදු රු.540,406 ක් 2014 ඔක්තෝබර් මාසය දක්වාත් දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුවට යවා නොතිබුණි.

**(ඇ)** සභාවේ සේවය කරන ලද මාරු වී ගිය සහ විශ්‍රාම ගිය සේවකයන් 16 දෙනෙකුගෙන් අයකර ගත යුතුව තිබූ රු.34,247 ක ණය ශේෂයක් 2009 වර්ෂයට පෙර සිට අයවීම් හිඟහිටව තිබුණ ද, 2014 ඔක්තෝබර් 03 දින තෙක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**3.2 නිශ්ක්‍රීය වත්කම්**

-----------------

2013 ජුනි 05 දිනැති අංක : PCMD/PR/2013 දරන ජනාධිපති ලේකම්වරයාගේ චක්‍රලේඛය පරිදි රජයේ ආයතන තුළ ප්‍රයෝජනයට නොගෙන විනාශ වෙමින් පවතින පැරණි වාහන හා යන්ත්‍රෝපකරණ 2013 සැප්තැම්බර් 05 දින වනවිට අපහරණය කිරීමට වැඩපිළිවෙලක් සකස් කරන ලෙසට දන්වා තිබුණි. නමුත් සභා භූමිය තුළ හා උපකාර්යාල භූමිය තුළ රු.3,900,000 ක් වටිනා බැකෝලෝඩර් යන්ත්‍රයක්, අත් ට්‍රැක්ටරයක් හා ජල බවුසරයක් දිරාපත් වෙමින් පවතින බව විගණනයේදි නිරීක්ෂණය වූ නමුත් ඒ සම්බන්ධයෙන් උපදෙස් ප්‍රකාරව කටයුතු කර නොතිබුණි

**3.3 කොන්ත්‍රාත් පරිපාලනය**

---------------------------

සභා බලප්‍රදේශය තුළ ව්‍යාපෘති 09 ක් ක්‍රියාත්මක කිරීම සඳහා ලැබී තිබූ රු.315,000 ක් අදාළ ව්‍යාපෘති සඳහා ප්‍රයෝජනයට නොගෙන 2014 ඔක්තෝබර් මාසය වනවිටත් කර්මාන්ත බැංකු ජංගම ගිණුමෙහි නිශ්ක්‍රීයව රඳවාගෙන තිබුණි.

**4. පද්ධති හා පාලන**

----------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) අයවැය පාලනය
(ඇ) ආදායම් පරිපාලනය
(ඈ) වත්කම් කළමනාකරණය